// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1946/37 - 2015 දෙසැම්බර් මස 23 වැනි බදාදා - 2015.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි හා "අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් විසින් රාජ්‍ය අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් වෙත කාර්යභාරයන් පවරාදීම" යන කරුණට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කෙරෙන නිවේදනය

"අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් විසින් රාජ්‍ය අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් වෙත කාර්යභාරයන් පවරාදීම" යන කරුණට අදාළව 2015.10.07 වන දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයට අදාළව 2015.10.21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළැඹි තීරණය අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයාට පැවරෙන කාර්යයන් හා කර්තව්‍යයන් 2015 නොවැම්බර් මස 16 දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ම විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. හැරිසන්,
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය.

වර්ෂ 2015 ක් වූ නොවැම්බර් මස 16 දින,
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. පශු සම්පත් සංවර්ධන විෂයයට අදාළ ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යවරයාට සහයවීම.
2. ග්‍රාමීය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ජාතික හා ප්‍රාදේශීය ප්‍රතිපත්ති සම්පාදනය, උපාය මාර්ග සම්පාදනය හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ගරු අමාත්‍යවරයාට සහයවීම.
3. ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට අදාළ අයවැය හා ජාතික වැඩසටහන් සකස් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය, වෙනත් අමාත්‍යාංශ හා මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය කරමින් ගරු අමාත්‍යතුමාට හා අමාත්‍යාංශයට සහයවීම.
4. අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරෙන නැගෙනහිර පළාතේ පශු සම්පත් සංවර්ධන කටයුතු, අධීක්ෂණය, නියාමනය හා ඇගයීම හා ඒ සඳහා ගරු අමාත්‍යතුමාට හා අමාත්‍යාංශයට සහයවීම.
5. මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කෙරෙන ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය, නියාමනය හා ඇගයීම.
6. පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නවලට පිළිතුරු දීම හා ඒ සඳහා ගරු අමාත්‍යවරයාට සහයවීම.
7. ගරු අමාත්‍යතුමා විදේශගතවන හෝ නිවාඩු ලබා ඇති අවස්ථාවලදී ගරු අමාත්‍යතුමා වෙනුවෙන් වැඩ බැලීම.
8. ගරු අමාත්‍යතුමා විසින් විටින් විට පවරනු ලබන වෙනත් රාජකාරී.

01 - 445

1A - G 22771 — 358 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*